# මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# තනතුරු පුරප්පාඩු දැන්වීමයි

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | සහකාර සුබසාධක කොමසාරිස් (පාලන) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>සහ<br>III. පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |
| 02 | සහකාර සුබසාධක කොමසාරිස් (සංවර්ධන හා පර්යේෂණ) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය /ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br>සහ<br>III. පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |
| 03 | සහකාර සුබසාධක කොමසාරිස් (සන්නිවේදන) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සන්නිවේදනය/ අලෙවිකරණය/ ව්‍යාපෘති කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br>සහ<br>III. පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |
| 04 | සහකාර සුබසාධක කොමසාරිස් (සමාජ ආරක්ෂණ) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව/ සමාජ විද්‍යාව/ සමාජ අධ්‍යයනය/ සමාජ සංවර්ධනය/ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br>සහ<br>III. පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |

| | | | |
|---|---|---|---|
| 05 | සහකාර සුබසාධක කොමසාරිස් (සුපරීක්ෂණ හා ඇගයීම්) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව/ ව්‍යාපෘති කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br>සහ<br>III. පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |
| 06 | සහකාර සුබසාධක කොමසාරිස් (තොරතුරු තාක්ෂණ - පද්ධති සංවර්ධන) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම. |
| 07 | සහකාර සුබසාධක කොමසාරිස් (මූල්‍යය) MM-1-1 | 01 | IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම(පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>හෝ<br>I. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් හිමිකර ගෙන තිබීම.<br>හෝ<br>II. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීයය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අතරමැදි හෝ බලපත්‍ර II හෝ ව්‍යාපාර මට්ටම සමත් වී තිබීම.<br>හෝ<br>III. එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීයය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනයක් මඟින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ විභාගයේ හෝ උසස් විභාගයේ I සහ II කොටස් සමත් වී තිබීම.<br>හෝ<br>IV. එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීයය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ පළමු වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක විභාගයකින් සමත් වී තිබීම.<br>සමඟ<br>V. ඉහත අවශ්‍යතා ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම. |
| 08 | සහකාර සුබසාධක කොමසාරිස් (තොරතුරු තාක්ෂණ - මෙහෙයුම්) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරුකරණය හෝ තොරතුරු තාක්ෂණයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>II. පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ |

| | | | |
|---|---|---|---|
| | | | තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම. |

**වයස :**
අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**
මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ඉන් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**බඳවාගැනීමේ කොන්දේසි :**
මෙම තනතුර ස්ථිරය. තනතුර ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වැටුප :**
MM 1-1-2016 රු. (53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575) + රජයේ අනුමත වෙනත් දීමනා
වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.12.27 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, පළමු මහල, නව ගොඩනැගිල්ල, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හෝ wbb.commisioner.vacancy@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ හැකිය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ හා අසම්පූර්ණ අයදුම්පත් අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර විද්‍යුත් තැපැල මඟින් අයදුම්පත් යොමුකිරීමේදී විෂය (Subject) යටතේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්ගේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**පළමු මහල, නව ගොඩනැගිල්ල**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**කොළඹ 01**